The Buddhist
පන්සල
Temple

පෝය දින පණිවුඩය
අමා ගඟුල
POYA DAY MESSAGE

ශ්‍රී. බු. ව. 2552 ඇසළ මස කලාපය: ව.ව.2008ක් වූ ජූලි මස 17 වන දින

කලාප අංක: 07

*නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස...!!!*

# <u>කල්‍යාණ මිත්‍ර සම්පත්තියෙන් සමාජයට සේවය කරමු.</u>

**නභජේ පාපකේ මිත්තේ නභජේ පුරිසාධමේ**
**භජේථ මිත්තේ කල්‍යාණේ භජේථ පුරිසුත්තමේ**

**ධම්ම පදය- පණ්ඩිත වග්ගය**

**කාරුණික පින්වත**

අද ඇසල පුර පසළොස්වක පොහොය දිනයයි. භාරත දේශයෙහි චක්‍රවර්ති රජෙකු සේ ජීවත් වූ ධර්මාශෝක මහ රජතුමාගේ පුතනුවන් වූ මිහිඳු මාහිමියන් සිරිලක් වැසියන්ට කල්‍යාණ මිත්‍රයෙකි. එම කල්‍යාණ මිත්‍රයා ලංකාවට වැඩම කොට දේශනා කළ සූත්‍රය අතර බාල පණ්ඩිත සූත්‍රයද එකකි. එම නිසා අද පෝය දිනයෙහි කල්‍යාණ මිත්‍රයා හඳුනාගෙන අපේ ගිහි පැවිදි ජීවිත සැපවත් කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.

සූත්‍ර පිටකයෙහි ඛුද්දක නිකායට අයිති ධම්ම පද පාලියේ පණ්ඩිත වර්ගයට අයිති ගාථාවකි අප මුලින් සඳහන් කළේ. එහි සරල අදහස නම් පව්වු මිතුරන් ඇසුරු කරන්න එපා, අධම පුරුෂයන් ඇසුරු කරන්න එපා, කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරන්න. උත්තම පුරුෂයන් ආශ්‍රය කරන්න. බාලපණ්ඩිත සූත්‍රයෙන්ද මිහිඳු මාහිමියන් සිරිලක් වැසියන්ට මතක් කළේ බාලයින්ගෙන් ඈත්ව පණ්ඩිතයින් ඇසුරුකළ යුතු බවයි. දිනක් ආනන්ද හිමියන් බුදුන්වහන්සේට කියා සිටියේ, ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස මේ බුදුසසුනෙන් හරි අඩක් පවතින්නෙ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මත බවයි. එහිදී බුදුන්වහන්සේ දේශනා කළේ ආනන්දය එසේ නොකියන්න, මේ මුළු බුදුදහමම පවතින්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය උඩය, යනුවෙනි. මිහිඳු මාහිමියන් සිරිලක් වැසියන්ටද හඳුන්වා දුන්නේද එම පණිවිඩයමයි.ඒ නිසා මෙම ධර්ම පත්‍රිකාවෙන් එම සදහම් පණිවිඩය හඳුනා ගනිමු.

මංගල සූත්‍රය දේශනා කළ අවස්ථාවේදී බාලයන් ඇසුරුනොකළ යුතුයි, පණ්ඩිතයන් ඇසුරු කළ යුතුයි, යනුවෙන් දේශණා කළේ පුද්ගල ජීවිතය හොඳ පැත්තට හෝ නරක පැත්තට හරවා ගැනීමට ඇති ප්‍රබලම සාධකය ආශ්‍රය වීමයි. දෙමාපියන් දරුවන්ට ඉටුකළ යුතු යුතුකම් අතර මුලින්ම දේශනා කළේ පවින් වලකා යහපතෙහි යෙදවීමයි. මේ සියලු කරුණු වලින් බුදු දහම අපට උගන්වන්නෙ පුද්ගල අභිවෘද්ධිය මෙන්ම සමාජ අභිවෘද්ධිය සඳහා කල්‍යාණ මිත්‍ර සම්පත්තිය අත්‍යවශ්‍යවන බවය.

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය පිළිබඳ කථා පුවත් බෞද්ධ සාහිත්‍යයේ කොතෙකුත් දැකිය හැකිය. එදා ජීවත් වූ දේවදත්ත හිමියන් සහ අජාසත්ත කුමාරයා කල්‍යාණ මිත්‍රයෝ දෙපලකි. ඒ දෙදෙනාටම තිබුණේ නරක පිපාසාවෝය. දේවදත්ත හිමියන්ගෙ බලාපොරොත්තුව වූයේ බුදුන්වහන්සේගේ ජීවිතය තොර කොට බුදුවීමයි. අජාසත්ත කුමරුගේ අදහස වූයේ පියා මරා රජකම ලබා ගැනීමයි. මේ දෙන්නාගේ ක්‍රියා කලාපය තුලින් පැහැදිලි වන්නේ නරක කල්‍යාණමිත්‍ර සම්පත්තියක් ප්‍රදර්ශනය කිරීමයි. මෙහි එන දේවදත්ත හිමිගේ කථා පුවත ඇසුරු කරගෙන හොඳ කල්‍යාණමිත්‍ර සම්පත්තියක් හඳුනාදීම මෙහි අරමුණයි.

දේවදත්ත හිමියන් බුදුන්වහන්සේගේ ජීවිතය තොර කිරීම සඳහා පළමුවෙන්ම කළේ දුනුවායන් යැවීමයි. එය අසාර්ථක වු පසු ගිජුකුළු පර්වතයට නැගී ගල් පෙරලූහ. එයත් අසාර්ථක වූ නිසා තිරිසන්ගත සතෙකු යොදාගෙනවත් තම නරක පිපාසාව සන්සිඳවා ගැනීමට කල්පනා කළහ. මෙසේ සිතූ දේවදත්ත හිමියන් ඇත්හලට ගොස් එහි සිටි මද කිපුණු දරුණුම ඇතා වූ නාලාගිරියා මේ සඳහා යොදා ගත්හ. නාලාගිරි ඇතා දිනකට රා කළ අටක් බොන නිසා හෙට දහසක් පොවා

හෙණ්ඩුවලින් ඇණ කුලප්පු කොට තථාගතයන් වහන්සේ ඉදිරියට එවීමට කටයුතු සූදානම් කළහ. ඒ බව දැනගත් සැදැහැවත් උපාසක උපාසිකා පිරිස බුදුන් වහන්සේට කියා සිටියේ හෙට දිනයේ පිණ්ඩපාතයෙහි නොගොස් පන්සලේම වැඩ සිටින ලෙසයි.

තථාගතයන් වහන්සේ එහිදී කල්පනා කළේ හෙට දිනයේ මම නාලාගිරියා දමනය කොට පිඬු පිණිස නොහැසිර විහාරයට වැඩම කරන බවයි. හෙට දිනය උදාවිය. දරුණු නාලාගිරියා රා කල දහසයක් බී මිනීමරුවකු ලෙසින් පාරට බැස ඇත. හසුවන හසුවන දේ විනාශ කරමින් නාලාගිරි නම් ඇතා බුදුන් වහන්සේ ඉදිරියට එයි. ආනන්ද හිමියන් ජීවිත පරිත්‍යාගයෙන් යුතුව බුදුන්වහන්සේ ඉදිරියේ සිටී. තථාගතයන් වහන්සේ තෙවරක්ම ආනන්ද හිමියන්ට පසෙකට යන ලෙස දේශනා කළද කල්‍යාණ මිත්‍රත්වය නිසා එසේ නොකළහ. ඉන් පසුව බුදුරජාණන්වහන්සේගේ සෘධිබලය යොදා ආනන්ද හිමියන් පසෙකට ගෙන නාලාගිරි නම් ඇතා දමනය කළ සේක.ඉන් අනතුරුව ඇතාට බණ දේශනා කොට ඇත් හලට යවා පිඬු පිණිස නොහැසිර නැවත විහාරයට වැඩම කළ සේක. විහාරයට වැඩම කොට ගඳකිළියේ වැඩසිටින බුදුන්වහන්සේට දම්සභා මණ්ඩපයෙන් කිසියම් කථාවක් ඇසෙයි. අනේ පුදුමයකි, ආනන්ද හිමියන් වැනි අය දැකිය හැකිද මිනීමරු නාලාගිරියා එන ඉදිරියට යන්නේ කවුද, යනුවෙනි.තථාගතයන් වහන්සේ එතනට වැඩමවා, මහණෙනි ඔය ආනන්ද ජීවිතය පරිත්‍යාග කළේ අද පමණක් නොවේ. මීට පෙරත් මා වෙනුවෙන් සිය ජීවිතය පූජා කළ කල්‍යාණ මිත්‍රයෙක්, යැයි වදාළ සේක. ඒ ප්‍රවෘත්තිය කෙසේදැයි ඇසූ කළ තථාගතයන් වහන්සේ චුල්ලහංස ජාතකය දේශනා කළ සේක. එම කථා පුවත ගිහි පැවිදි අප හැම දෙනාටම කල්‍යාණමිත්‍ර සම්පත්තිය හඳුනා ගැනීමට ඉතා වැදගත්ය.

අප මහ බෝසතාණන්වහන්සේ එක්තරා ආත්මයක හංස කුලයක උපන්නේ හංසයින් අනූහය දහසකට නායකව කටයුතු කරයි. සුමුඛ නමින් හංස සේනාධිපතියෙක් ද විය. හංසයෝ කීපදෙනෙක් මිනිස් ලොව එක් විලකට අවුත් ගොදුරු අනුභව කොට ධ්‍රෘතරාෂ්ට නම් රාජ හංසයා වෙත ගොස් කියන්නෙ මිනිස් ලොව ඉතා හොඳ විලක් ඇත. ගොදුරු බොහෝය. ඒ විලට ගොස් ගොදුරු සොයාගෙන එන්නේ නම් මැනවි. එවිට ධ්‍රෘථරාෂ්ට නම් රාජ හංසයා ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

නමුත් හංස සමූහයාගේ බලවත් ඉල්ලීම නිසා ඒ අදහසට එකඟ විය. හංසයින් අනූහය දහසක් සමග ගොදුරු සඳහා විලට බසින විටම රාජ හංසයාගේ කකුල මලයක බැඳිනි. ගලවා ගැනීමට උත්සහ කලද නොහැකි විය. මා උගුලකට හසුවී ඇතැයි ශබ්දයක් නිකුත් කලොත් මගේ පිරිවර හංසයින් බඩගින්නේම පළා යන්නේය. එවිට උන් මහ මුහුදේ වැටී මිය යන්නේය. එබැවින් වේදනාව ඉවසා ගෙන සිටිමි. උන් හැම ගොදුරු කා සතුටුවන විට මා කරදරයකට පත්ව ඇතැයි ශබ්දයක් නිකුත් කරමි. මෙසේ ටික වෙලාවක් ගිය පසු හංස සමූහයා ගොදුරු කා අහසෙහි පියාසර කරන්නට පටන් ගත්හ. ඒ සලකුණෙන් පසුව රාජ හංසයා තමාට කරදරයක් වී ඇතැයි හඬක් නිකුත් කළහ. ඒ ශබ්දය ඇසෙන විට සියලුම හංසයෝ බියට පත්ව පලා ගියහ. උන් ගියේ කණ්ඩායම් තුනකටය. සුමුඛ නම් හංස සේනාධිපතිතුමා කණ්ඩායම් තුනම පරීක්ෂාකර බලන්නේය රාජ හංසයා නොදැක නැවත විලට එන්නේ උගුලෙහි බැඳී සිටි රජතුමා වෙත පැමිණියේය. එවිට රාජ හංසයා කියන්නෙ මිත්‍රය මෙතන කරදර සහිතය. හැකි ඉක්මනින් මෙතනින් ඉවතට ගොස් තම ජීවිතය ආරක්ෂා කර ගන්න කියාය. එහිදී සුමුඛ නම් හංස සේනාධිපති කියන්නේ රජතුමනි ඔබතුමා කරදරයක පත්වී සිටින විට ඔබතුමා අතහැර යාමට නොහැකි බවයි. මෙහිදී සුමුඛ නම් හංස සේනාධිපතියා කල්‍යාණ මිත්‍රයකු ලෙස ක්‍රියා කරමින් තම රජතුමාට ජීවිතය පරිත්‍යාග කළ සැටි පැහැදිලිය.

ධ්‍රෘතරාෂ්ට නම් රාජ හංසයා සහ සුමුඛ නම් හංස සේනාධිපතියා සිටින තැනට මුගුරක් ඔසවා ගත් වැද්දා පැමිණේ. දුරසිටම වැද්දාට කුතුහලයක් ඇතිවිය. මලය ඇටෙව්වේ එක සතෙකුටයි. නමුත් මෙතන හංසයෝ දෙදෙනෙක් සිටී. තමා ලංවන විට එක් හංසයෙක් බියෙන් පියාසර කරනු ඇතැයි සිතා වැද්දා එතනට ලංවිය. නමුත් දෙදෙනාම සිටී. වැද්දා තම අතේ තිබුණු මුගුර ඉවතට දමා එතනට ගොස් එක සතෙකුට මල ඇටවූ තැන දෙදෙනෙකු සිටීමට කරුණු විචාලහ. එවිට සුමුඛ නම් හංස සේනිධිපතියා කියන්නේ, වැදි පුත්‍රය, මේ අපගේ රජතුමාය, එතුමා විපතට පත් වූ විට අතහැර දමා යා නොහැක. රජතුමා අල්වා ගත්තේ ක්‍රීඩාව සඳහා නම් ඒ සඳහා මා යොදවා ගන්න. මස් පිණිස අල්වා ගත්තා නම් මා යොදා ගන්න.කල්‍යාණ මිත්‍ර සුමුඛයන්ගේ බස් ඇසූ වැදි පුත්‍රයා හංසයින් දෙදෙනාටම ජීවිත දානය දුන්හ. මේ පැරණි ප්‍රවෘත්තිය දේශණා කරමින් තථාගතයන් වහන්සේ භික්ෂූන්ට දේශනා කළේ "මහණෙනි, මේ ආනන්ද හිමියන් මට ජීවිත පරිත්‍යාග කලේ අද විතරක් නොවන බවයි.

ඇසල පොහොය දිනයෙහි සිරිලක වැඩම කළ මිහිඳු මාහිමියන් බාල පණ්ඩිත සූත්‍රයෙන් ද දේශණා කළේ කල්‍යානණ මිත්‍ර සම්පත්තියේ වටිනාකමයි. චුල්ල හංස ජාතකයෙන් නිර්දේශ කරන ලද සුමුඛ නම් වූ ආනන්ද හිමියන්ගේ චරිතය සැමටම ආදර්ශ ගත හැකි පරමාදර්ශී ජීවිතයකි. කල්‍යාණ මිත්‍රයා නම් බිත්තියෙහි අඳින ලද සිතුවමකට සමානය. මිතුරාගේ සැපේදීම දුකේදී ද එක සමානව ක්‍රියා කරයි. බෞද්ධයින් හැටියට අපේ චරිතය ද එසේ සකසා ගැනීමට උපදෙස් දීම මේ ලිපියෙහි අරමුණයි.

දිනක් බුදුන්වහන්සේ වෙත පැමිණි එක්තරා දිව්‍ය පුත්‍රයෙක් ප්‍රශ්ණයක් ඇසීය. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස,

තමාගේ ගෙදර තමාට සිටින හොඳම මිත්‍රයා කවරේද? කිංසු මිත්තං සකෙ ඝරෙ. ඊට ලැබුන පිළිතුර වූයේ මාතා මිත්තං සකෙ ඝරෙ, මව තමාට සිටින හොඳම මිත්‍රයා බවයි. මව කියා පිළිතුරු දී තිබුණත් දෙමාපියන්ම ගෙදර සිටිනා මිත්‍රයන් බව අමතක නොකළ යුතුය. නමුත් එම මිත්‍රයන් දෙදෙනා සමහර දරුවන්ට පෙනෙන්නෙ ගෙදර සිටිනා වධ දෙකක් හැටියටය.වයසට ගිය විට ඒ දෙදෙනාගේ කටයුතු ඔවුන්ට කර ගැනීමට නොහැකි වෙයි. එවිට දරුවන්ට ඒ දෙමාපියන් වධයක් හැටියට පෙනෙයි. එවිට ඉන් මිදීම සඳහා කල්‍යාණ මිත්‍ර දෙමාපිය දෙපළ මහලු නිවාසයකට ගෙන ගොස් නතර කරයි.එතන ඒ දෙපළ ජීවත් වන්නේ සතුටින් නොවේ. ඒ දෙදෙනාගේ මව ඒ දරුවන් බිහිකිරීමේදී තම ජීවිතය ඒ දරුවා වෙනුවෙන් පරිත්‍යාග කරයි. තම ජීවිතය රැක ගැනීම සඳහා පවත්නා රුධිරය කිරි බවට පත්කොට දරුවාට පොවා පෝෂණය කරයි. පියා දෑතේ වීර්යෙන් ධනය හම්බකර දරුවන් පෝෂණය කරයි. එවැනි දෙපලක් මහලු නිවාසයකට ගොස් නතර කිරීමට හේතුව ඒ දෙදෙනා වයසට යෑමයි. නමුත් සුමුඛ නම් හංසයා කියා සිටියේ උගුලට හසු වූ පමණින් රජතුමා තනිකර මෙතනින් යා නොහැකි බවයි. ඒ නිසා දූදරුවන් හැටියට ක්‍රියා කරන අපි හැමෝම සුමුඛ චරිතය ආදර්ශයට ගනිමින් අපේ දෙමාපියන්ට කල්‍යාණ මිත්‍රයන්ට සේ සැලකිය යුතුය.

විවාහ ජීවිත ගතකරන බොහෝ දෙනා අතරද මේ කල්‍යාණ මිත්‍ර ගුණය නොපවතින බව කිව යුතුය. සත්ත හරියා සූත්‍රය කියන පරිදි මිතුරෙක් මිතුරියක් සමග ජීවත් වන පවුල් ජීවිතය පරමාදර්ශී ජීවිතයකි. දෙදෙනා අතරම අඩුපාඩුකම් තිබිය හැක. ඒ කොතරම් අඩුපාඩුකම් තිබුණත් සුමුඛ චරිතාදර්ශයට අනුව කටයුතු කළහොත් සතුටින් ජීවත් විය හැක. මෙයින් කියන්නේ මොනම කරදරයක් දෙදෙනාගෙන් කාට සිදුඋවත් එක් අයෙක් අතහැර දැමීමට නෙහැකි බවයි.

සමාජය තුළ ජීවත්වන භික්ෂුවද එවැනිම කල්‍යාණ මිත්‍රයෙකි. උන්වහන්සේ දිවා රෑ දෙකෙහිම ක්‍රියාකරන්නේ අනුන් වෙනුවෙනි. එවැනි ස්වාමින් වහන්සේලා රෝගි වු පසු බොහෝ විට සමාජය තුළ තනිවෙයි. නමුත් කල්‍යාණ මිත්‍රත්වය හොඳට හඳුනාගෙන සුමුඛ චරිතාදර්ශයට අනුව ක්‍රියා කරන්නේ නම් එවැනි භික්ෂූන් වහන්සේලාට පිහිටක් ලබා දිය හැකිය. නොබෝදා එවැනි කල්‍යාණ මිත්‍ර ස්වාමින් වහන්සේ නමක් අප සමග කීවේ මා වටා සිටි ගිහි පැවිදි කල්‍යාණ මිත්‍රයින් නිසා අද මම මේ තත්වයෙන් සිටින බවය. මේ සියලු කරුණු සිත්වලට ගෙන කල්‍යාණ මිත්‍ර ගුණයෙහි පිහිටා ක්‍රියා කිරීමට උත්සහවත් වීම ඇසල පොහොයේ අධිෂ්ඨානය විය යුතුයි.

මාතර, ශ්‍රී සුධර්ශී මහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර කපුගම සුධර්මරාමාධිපති
ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන් වහන්සේ විසිනි.



LAKRUHUNA
www.lakruhuna.com

Designed By MIRACLE CREATIVE GALLERY
054 222 2020